604

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

RICHMOND COLLEGE LIBRARY
* GALLE *

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 8 ශ්‍රේණිය

## බුද්ධ ධර්මය I

නම/විභාග අංකය :- ............................................................................ කාලය : පැය 02 යි.

**1 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා දී ඇති පිළිතුරු අතුරෙන් නිවැරදි හෝ වඩාත්ම ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1. සීලයෙන් සමාධියෙන් ප්‍රඥාවෙන් ලොව දෙව් මිනිසුන් අතර අග්‍ර වන්නේ,

   1.මහා බ්‍රහ්මයා ය  2. බුදු රජාණන් වහන්සේ ය  3. දෙව්දත් තෙර ය  4. වසවර්ති මාරයා ය

2. බුදු රජාණන් වහන්සේ මල්ල රට අනුපිය නම් අඹ වනයට වැඩම කළ අවස්ථාවේ පැවිද්ද ලබාගත් තෙරවරුන්ට අයත් නොවන්නේ,

   1. භද්දිය  2. ආනන්ද  3. දේවදත්ත  4. නන්ද

3. දෙව්දත් තෙර සංඝ භේදයක් ඇති කිරීමට කළ කටයුත්ත නම්,

   1. බුදු රජාණන් වහන්සේ මැරවීමට කුමන්ත්‍රණ කිරීම
   2. නාලාගිරි ඇතාට රා පොවා බුදුරදුන් ඉදිරියට එවීම
   3. බුදුරදුන්ගෙන් වර පහක් ඉල්ලා සිටීම
   4. ගිජ්ජකූට පර්වතයට නැගී බුදුරදුන්ට ගලක් පෙරළීම

4. උපසම්පදාවෙන් වස් සියයක් ඉක්ම වූ මෙහෙණියක් වුව ද එදිනම උපසම්පදාව ලද භික්ෂුව දැක වැඳිය යුතුය. ගරු කළ යුතුය. මෙම කරුණ අයත් වන්නේ,

   1. අෂ්ටලෝක ධර්ම වලට ය  2. අෂ්ට ගරු ධර්ම වලට ය
   3. අට මහ කුසල් වලට ය  4. අරි අටඟි මගට ය

5. සිදුහත් කුමාරයාගේ සොහොයුරාද, සුද්ධෝදන රජුගේ හා මහා ප්‍රජාපතී ගෝතමී දේවියගේ ද පුතා වන්නේ,

   1. නන්ද කුමරු  2. ආනන්ද කුමරු
   3. ආලවක කුමරු  4. නාලක කුමරු

6. "ස්වාමීනි, අපි යම් කථාවකින් උනිමු නම් ඒවා භාග්‍යවතුන් වහන්සේට පසු වත් ඇසීමට දුර්ලභ නොවේ. ඔබ වහන්සේගේ අරුත්බර දේශනාව කරන්න." යනුවෙන් බුදුරදුන්ට ප්‍රකාශ කළේ,

   1. සෝණදණ්ඩ බමුණා ය  2. සකුළුදායී පිරිවැජියා ය
   3. සුභද්‍ර පිරිවැජියා ය  4. සුදත්ත සිටුවරයා ය

7. බුදු රජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලාගේ පරිහරණය පිණිස විහාර වර්ග පහක් අනුමත කළේ,

   1. රජගහ නුවර සිටුවරයාගේ ඉල්ලීම පරිදි ය  2. පිය රජතුමාගේ ඉල්ලීම පරිදි ය
   3. තම අභිමතය පරිදි ය  4. කොසොල් මහ රජතුමාගේ ඉල්ලීම පරිදි ය

8. අප භාවිතා කරන ඉතිපිසෝ, ස්වාක්ඛාතෝ, සුපටිපන්නෝ යන ගාථාවන්හි ඇතුළත් ගුණ ගණන

1. 20 කි  2. 15 කි  3. 18 කි  4. 24 කි

9. සිදුහත් බෝසතාණෝ බුදු වූයේ,

1. අවුරුදු 29 දී ය  2. අවුරුදු 35 දී ය

3. අවුරුදු 55 දී ය  4. අවුරුදු 16 දී ය

10. ධර්මය ප්‍රගුණ කරන්නාට කල් නොයවාම ධර්මයේ ප්‍රතිඵල ලැබෙන බැවින් ධර්මය,

1. ස්වාක්ඛාත නම් වේ  2. සන්දිට්ඨික නම් වේ

3. අකාලික නම් වේ  4. ඒහිපස්සික නම් වේ

11. පැරණි සිරිත් අනුව ගණ දෙවියන්ට හා සරස්වතී දේවියට පූජා වට්ටියක් තබා දේවාශිර්වාද ලබා ඉටුකරන උත්සවය වන්නේ,

1. උපන්දින උත්සවයයි  2. අත්පොත් තැබීමේ උත්සවයයි

3. සරණ මංගල්‍ය උත්සවයයි  4. ගෘහ ප්‍රවේශ මංගල්‍යයයි

12. "කිරිකඩ හේල" නමින් හඳුන්වන්නේ,

1. උස ගසකි  2. කිරි ගසකි

3. වස්ත්‍රයකි  4. කිරි මිශ්‍ර ආහාරයකි

13. තමන්ට නිසි මග පෙන්වා දුන් ගුරුවරයා සිටි දිශාවට දිනකට තෙවරක් නමස්කාර කළේ,

1. අස්සජි මහ රහතන් වහන්සේ ය  2. සැරියුත් මහ රහතන් වහන්සේ ය

3. මුගලන් මහ රහතන් වහන්සේ ය  4. මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ ය

14. අෂ්ටාංග ශීලය සමාදන්වීමේ දී මහා සයන පාවිච්චි කළ නොහැක. මෙම මහා සයන වලට අයත් වන්නේ,

1. මධ්‍යම පුරුෂයෙකුගේ රියනට වඩා උස් පා ඇති ඇඳ ය
2. මධ්‍යම පුරුෂයෙකුගේ රියනට වඩා උස් පා ඇති පුටු ය
3. රබර්, කුෂන් හා ස්ප්‍රින් යොදා සැකසූ අධික සැප සහිත ආසන ය
4. සිල් සමාදන් වන විට බිමට අතුරණ පැදුරු, ඉටිකොළ වැනි දෑය

15. කොසොල් රට මහ රජතුමාගේ පුරෝහිත තනතුරේ සිටි භග්ග නම් බමුණාට දාව මන්තාණි නම් බැමිණියට උපන් පුත් කුමරා වූයේ,

1. මට්ටකුණ්ඩලී ය  2. දේවදත්ත ය  3. නන්ද ය  4. අහිංසක ය

16. මහතෙල් සුවඳ මය

...... පිළි ගඳ මය මෙම පද්‍යයේ හිස්තැනට ගැළපෙන පිළිතුර වන්නේ,

1. තල් මසු යන්නය  2. කුඩ මසු යන්නය

3. ඉරමුසු යන්නය  4. රත්මසු යන්නය

17. අප අඳින ඇඳුම තෝරා ගැනීමේ දී,

1. එහි ඇති මෝස්තරය ගැන සලකා බැලිය යුතුය
2. අපගේ හැදියාව, සංස්කෘතිය හා තත්ත්වය පිළිබඳ සලකා බැලිය යුතුය
3. කය නිරාවරණය වන ඇඳුම් තෝරාගත යුතුය
4. කීප දෙනෙකුට පාවිච්චි කළ හැකි එකක් ද යන්න සලකා බැලිය යුතුය

18. අයිතිකරුට නොපෙනෙන සේ නො දනෙන සේ යමක් ගැනීම,

1. ප්‍රාණඝාතයයි
2. සුරාමේරයයි
3. අදත්තාදානයයි
4. මුසුවාදයයි

19. විදේශීය ආක්‍රමණිකයෙක් වූ එළාර රජු පැරදවූ දුටුගැමුණු රජතුමා එළාර රජු වෙනුවෙන් සොහොනක් කරවා ගරු කිරීමෙන් පෙන්නුම් කළේ ශ්‍රී ලාංකිකයන්ගේ,

1. පරිත්‍යාගශීලීත්වයයි
2. විශේෂත්වයයි
3. සහජීවනයයි
4. ආගන්තුක සත්කාරයයි

20. සිංහල ජාතිය නමැති ළදරුවා හැදී වැඩී පෝෂණය වූ තොටිල්ල ලෙස හඳුන්වන්නේ,

1. බුදු දහමය
2. බ්‍රාහ්මණ දහමය
3. ඉස්ලාම් දහමය
4. කිතු දහමයි

(2 x 20 = 40)

## II කොටස

1 පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

1. i. බුදුගුණ සිහිකර වඩනු ලබන භාවනාව නම් කරන්න.
   ii. එම භාවනාව වැඩීමේ ආනිශංස දෙකක් ලියන්න.
   iii. බුදුරදුන් කියා දුන් තෙරුවන් ගුණ ඇතුළත් ගාථා තුනක් සිහිපත් කරමින් මහ මඟ ගමන් කරන විට සොරු කණ්ඩායමක් විසින් මරා දමුණු තරුණයා සහ ඔහුගේ ගුරුවරයාගේ නම් පිළිවෙලින් ලියන්න.
   iv. භාවනා වඩන විට පිරිමි දරුවන් සහ ගැහැණු දරුවන් වාඩි වී සිටිය යුතු ඉරියව් පිළිවෙලින් ලියන්න.
   v. අරහං බුදු ගුණය හඳුන්වන්න. (4 x 5 = 20)

2. i. බුදු රජාණන් වහන්සේ විසින් භික්ෂූන් වහන්සේලාගේ ප්‍රසාදජනක පැවැත්ම සඳහා පෙන්වා දී ඇති ආචාර ධර්ම පද්ධතිය හඳුන්වන්නේ කෙසේද? (ලකුණු 02)
   ii. ඇඳුම් ඇඳීමේ පරමාර්ථ කීපයක් බුද්ධ දේශනාවේ පෙන්වා දී ඇත. ඉන් දෙකක් ලියන්න. (ලකුණු 03)
   iii. ලංකාවේ මාර්ග අනතුරු හේතුවෙන් දිනකට පුද්ගලයෝ 8ක් පමණ මිය යති. මෙවැනි අනතුරු හා මරණ වළක්වා ගැනීමට ගත හැකි පියවර විස්තර කරන්න. (ලකුණු 05)

3. i. සීලයේ ප්‍රභේද දෙකක් නම් කරන්න. (ලකුණු 02)
   ii. අෂ්ටාංග ශීලයේ එන පළමු සිල්පද තුන පිළිවෙලින් ලියන්න. (ලකුණු 03)
   iii. පන්සිල්වල පළමු සිල්පදය කඩ කරන අවස්ථා විස්තර කරන්න. (ලකුණු 05)

4. i. යස්ස පාපං කතං කම්මං ...... ගාථාව සම්පූර්ණ කරන්න. (ලකුණු 02)
   ii. එම ගාථාවේ අදහස ලියන්න. (ලකුණු 03)
   iii. කුඩා අවධියේ සිට දෙමාපිය, ගුරුවරු හා වැඩිහිටි අයගේ අවවාද අනුශාසනා පිළිපැදීමේ වටිනාකම විස්තර කරන්න. (ලකුණු 05)

5. i. සිගාලෝවාද සූත්‍රයට අනුව, බටහිර හා උතුර යන දිසා දෙකට අයත් සමාජ කණ්ඩායම් දෙක පිළිවෙලින් නම් කරන්න. (ලකුණු 02)
   ii. ස්වාමියා විසින් භාර්යාවට ඉටු කළ යුතු යුතුකම් (සාරධර්ම) 3 ක් නම් කරන්න. (ලකුණු 03)
   iii. ඉහත ii. සඳහන් කළ එක් යුතුකමක් ස්වාමියා විසින් බිරිඳට ඉටු කරන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05)

6. i. තමා බුදු දහම අගය කරන්නේ එමගින් කිසිවකු හිංසාවට පීඩාවට පත් නොකරන නිසා යැයි පැවැසූ බටහිර දාර්ශනිකයා නම් කරන්න. (ලකුණු 02)
   ii. මිහිඳු මහ රහතන් වහන්සේ විසින් මෙරටට හඳුන්වා දුන් බුදු දහම නිසා ශ්‍රී ලාංකීය බෞද්ධයන්ගේ දක්නට ලැබුණු උසස් මානව ගුණාංග 3 ක් ලියන්න. (ලකුණු 03)
   iii. බුදු සිරිතෙන් පෙන්වා දෙන ආගමික සහනශීලී ගුණය බෞද්ධ ජන සමාජයේ ද දක්නට ඇති අවස්ථා හඳුන්වන්න. (ලකුණු 05)

7. පහත මාතෘකා දෙකකට කෙටි සටහන් ලියන්න. (එක් කොටසකට ලකුණු 05 කි.)

   i. දණ්ඩක ප්‍රශ්නය ii. මුගලන් මහ රහතන් වහන්සේ
   iii. බුදුගුණ iv. අවමංගල්‍ය චාරිත්‍ර